සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

### 9 - ශ්‍රේණිය
### චිත්‍ර කලාව

නම/විභාග අංකය :- ............................................................ කාලය: පැය 02 ½ යි.

## I කොටස

- පහත සඳහන් ඡායාරූපය ඇසුරු කරගෙන අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



විශාල දාගැබ් වල සතර දිශාවේ දාගැබට සම්බන්ධ කර තැනූ මෙම ගෘහ නිර්මාණ අංගය (1)................................. නමින් හැඳින්වේ. අනුරාධපුර යුගයට අයත් මෙය දක්නට ඇත්තේ (2) ........................................................................ චෛතියේ ය. දාගැබේ (3) .......................................................................... හා අලංකාරය සඳහා තැනූ මෙම අංගයේ දෙපස ඇති ගල්කණුවල (4) ................................................ මෝස්තර කැටයම් කර ඇත. මෙය නිර්මාණය ඉදි කිරීම සඳහා භාවිත කර ඇත්තේ ගඩොල් හා (5) ............................................ ය.

- ප්‍රශ්න අංක 06 සිට 10 තෙක් අසා ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු සපයන්න.

(06) පාරම්පරික වෙස් මුහුණු කර්මාන්තයේ දී කිරි මැටි හෝ මකුළු මැටි දියකර පෙරා සකස් කර ගන්නා ආලේපය හඳුන්වන නම කුමක්ද? .......................................................

(07) මකරාගේ රූපයේ කන්දෙක නිර්මාණය සඳහා ආදර්ශය කර ගත් සත්ත්වයා නම් කරන්න .......................................................

(08) කලාත්මක අතින් උසස් කොරවක්ගල් අතර රත්න ප්‍රාසාදයේ කොරවක්ගල අයත්වන්නේ කුමන යුගයකටද? ...........................................................

(09) ශ්‍රී ලංකාවේ මුලින්ම පුවත්පතක පලවූ චිත්‍ර කතාව (නීලා) නිර්මාණ කළ ශිල්පියා කවරෙක්ද?.....................................

(10) නාට්‍ය වර්ග දෙකකි. එක් වර්ගයක් නාටයය ධර්මී ලෙස හඳුන්වනුලබයි. අනෙක් වර්ගය හඳුන්වන නම කුමක් ද? ........................................................................

- ප්‍රශ්න අංක 11 සිට 15 තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(11) හින්දු කෝවිල ආශ්‍රිතව පවත්වන උත්සව වලදී කඹ යොදා ඇදගෙන යන වාහන වර්ගය වන්නේ
1. කුදිරෙයි වාහනම් 2. මයිල් වාහනම් 3. සිම්ම වාහනම් 4. සප්පරම්

(12) දයා රාජපක්ෂ නම් චිත්‍ර ශිල්පියා විසින් නිර්මාණය කරන ලද චිත්‍ර කතාවක් වන්නේ,

1. අනුපමා  2. නලදමයන්ති  3. අත්තික්කා මල්  4. සුසීමා

(13) පියගැටපෙල නිර්මාණයේ දී එය අලංකාර කිරීම සඳහා භාවිත නොකළ කැටයම් රූපයකි.

1. වාමන රූප  2. වජ්‍ර සංකේත  3. පළාපෙති  4. ගවරූප

(14) මුරගල නිර්මාණය කිරීමේ දී එහි ඇතුළත් නොවූ කැටයම් අංගය වන්නේ

1. පුන්කලස  2. බහිරව රූපය  3. නාග රූපය  4. හංස රූපය

(15) වෘෂභ කුඤ්ඤරය නම් සැරසිල්ල සඳහා භාවිතා කල සත්ත්ව රූප වන්නේ,

1. ගවයා සහ ඇතාය  2. සිංහයා සහ ගවයාය  3. ඇතා සහ සිංහයාය  4. ගවයා සහ මකරා ය.

- **ප්‍රශ්න අංක 16 සිට 20 තෙක් දී ඇති රූපයට වඩාත් ගැළපෙන රූපය ඉදිරියේ ඇති A, B, C, D, E අක්ෂරයට අයත් රූප සටහන් ඇසුරින් තෝරා එයට අයත් ඉංග්‍රීසි අක්ෂරය වරහන් තුළ දක්වන්න.**

(16) 

(..............)

(17) 

(..............)

(18) 

(..............)


(19) 

(..............)

(20)  (..............)

A  (..............)

B  (..............)

C  (..............)

D  (..............)

E  (..............)

◆ ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා දක්වා ඇති ප්‍රකාශයන් නිවැරදි නම් හරි ( ✓ ) ලකුණද. වැරදි නම් ( ✗ ) ලකුණද ඉදිරියෙන් ඇති හිස්තැනේ යොදන්න.

(21) ප්‍රාග් ඓතිහාසික යුගයට අයත් ස්පාඤ්ඤයේ අල්ටමයිරා ගුහාවේ අඩි 17 ක් දිග ගව රූපය විශිෂ්ට නිර්මාණයකි. ......................................

(22) පද්‍යපංති, විශේෂාංග ලිපි ආදියෙහි අදහස අර්ථවත් කිරීම සඳහා සන්නිදර්ශන චිත්‍ර නිර්මාණය කරනු ලබයි. ......................................

(23) මූර්තියක් නෙලීමේ දී අනවශ්‍ය කොටස් කපා ඉවත් කරනු ලබයි. ......................................

(24) චීත්ත රෙද්දකට වඩාත් සුදුසු වන්නේ මුළුතල මෝස්තරයයි ......................................

(25) දිව්‍ය, සත්ත්ව, උද්භිද හා නිර්ජීව යනුවෙන් සම්ප්‍රදායික මෝස්තර වර්ග 4 කි. ......................................

◆ ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු **F, G, H, I, J** යන රූප සටහන් ඇසුරින් ලියන්න.




F



G



H



I



J

(26) F අක්ෂරයෙන් දැක්වෙන ........................................................ තුලින් හින්දු කෝවිලක ආරක්ෂාව සංකේතවත් වේ.

(27) G අක්ෂරයෙන් දැක්වෙන්නේ පොළොන්නරු ........................................................ ඇති කොරවක් ගලය.

(28) H රූපයේ දැක්වෙන ආසනයට ''වජ්‍රාසනය'' ලෙස නම් ලැබී ඇත්තේ එහි ............................................... සංකේතය දැකගතහැකි නිසාය.

(29) I රූපයේ දැක්වෙන සාම්ප්‍රදායික සැරසිලි ඒකකය නම්කරන්න. ...............................................................

(30) J රූපයේ දැක්වෙන්නේ දෙවොල්මඩු ශාන්තිකර්මයකි. එහි ප්‍රධාන සැරසිලි අංගය නම් කරන්න.

..........................................................................

- **ප්‍රශ්න අංක 31 සිට 35 දක්වා දී ඇති වචන පැහැදිලි වන සේ වාක්‍ය තනන්න.**

(31) ගණ කැපීම ..............................................................................................................

(32) ව්‍යාප්ත මෝස්තර ..............................................................................................................

(33) කුම්බාබිෂේකම් ..............................................................................................................

(34) බන්දුල හරිශ්චන්ද්‍ර ..............................................................................................................

(35) පර්යාවලෝකනය ..............................................................................................................

- **ප්‍රශ්න අංක 36 සිට 40 පහත සඳහන් උපශීර්ෂ යටතේ ඡායාරූප විස්තර කරන්න.**



(36) කලා කර්මාන්තය ..............................................................................................................
..............................................................................................................

(37) යොදාගන්නා සැරසිලි ..............................................................................................................
..............................................................................................................

(38) ප්‍රචලිත ප්‍රදේශ ..............................................................................................................
..............................................................................................................

(39) ප්‍රධාන ශිල්ප ක්‍රම ..............................................................................................................
..............................................................................................................

(40) වර්ණ භාවිතය ..............................................................................................................
..............................................................................................................

(ලකුණු 40)

## II කොටස - ද්‍රව්‍ය බලා ඇඳීම - පැය ½

- ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය පැන්සලෙන් පමණක් චිත්‍රනය කරන්න.
- ද්‍රව්‍ය වල ස්වභාවය, එළිය අඳුර පර්වායලෝකන ලක්ෂණ පෙනෙන සේ කොළයට සම්පීඩනය කර අඳින්න. (ලකුණු. 20 )

## III කොටස පැය - 1 ½

- පහත සඳහන් මාතෘකා අතුරින් එක් මාතෘකාවක් පමණක් තෝරාගෙන වර්ණවත් චිත්‍රයක් නිර්මාණය කරන්න.

<u>ප්‍රකාශන</u>

1. නගරය ආශ්‍රිතව ඇති වෙළඳපළක්
2. ආගමික ස්ථානයක පුද පූජාවක් සඳහා සහභාගි වන පිරිසක්
3. වන අලි රැළකට මැදි වූ සංචාරකයින් පිරිසක්

<u>මෝස්තර</u>

4. ස්වභාවික මල්, කොළ, ගෙඩි හා පොහොට්ටු හැඩතල යොදාගනිමින් මුද්‍රණය කිරීමට හැකි අයුරෙන් චිත්ත මෝස්තරයක් නිර්මාණය කරන්න.
5. වියුක්ත සත්ව රූප භාවිත කර, වාටි මෝස්තරයක් අඳින්න.
6. සමචතුරශ්‍රාකාර හැඩයේ කුෂන් කවරයක් සඳහා සාම්ප්‍රදායික සැරසිලි භාවිතකර මෝස්තරයක් නිර්මාණය කරන්න.

<u>ශ්‍රැෆික්</u>

7. ''කොවිඩ් වසංගතයෙන් ආරක්ෂා වෙමු.'' තේමාව යටතේ පෝස්ටරයක් නිර්මාණය කරන්න.
8. ළමා කතන්දර පොතකට පිට කවරයක් නිර්මාණය කර ඔබ කැමති නමක් යොදන්න.

(ලකුණු 40)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

**9 - ශ්‍රේණිය**


**චිත්‍ර කලාව - රේඛාමය අධ්‍යයනය**

**කාලය පැය ½ යි.**

**II** පත්‍රය

කාලය පැය ½

- **පෙට්ටියක් (උස 10 cm, පළල 20 cm, දිග 28 cm)** (ලකුණු 20)
- මැටි කලයක්
- කොළ 5 ක ක්‍රෝටන් අත්තක්
- වීදුරුවක් ( වතුර බොන)
- ධාරකයක්



සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

## 9 - ශ්‍රේණිය

## චිත්‍ර කලාව පිළිතුරු

### I පත්‍රය

(01) වාහල්කඩ / ආයක / ආයික

(02) මිහින්තලේ කණ්ඨක චෛත්‍යය

(03) ආරක්ෂාවට / ශක්තිමත් බවට

(04) කල්පලතා / කල්ප වෘක්ෂ / නිදහස් සත්ත්ව මෝස්තර

(05) ගල් ය.

(06) අල්ලියාදු

(07) ඌරා

(08) අනුරාධපුර යුගය

(09) ජී.එස්. ප්‍රනාන්දු මයා

(10) ලෝක ධර්මී

(11) iv (සප්පරම්)

(12) අනුපමා

(13) ගව රූපය

(14) හංස රූපය

(15) ගවයා සහ ඇතා

(16) C

(17) D

(18) E

(19) A

(20) B

(21) ✗

(22) ✓

(23) ✓

(24) ✗

(25) ✓

(26) යාලිරූව

(27) වටදාගෙය

(28) වජ්‍ර

(29) පංචනාරීඝටය

(30) පත්තිනි තොරණ, දෙවොල් තොරණ, මඩුව සැරසීම

(31) වෙස්මුහුණු නිර්මාණයේ දී ලී කඳන් කපා පොතු ගසා කැබලි වලට කපා ගැනීම ගණ කැපීම ලෙස හඳුන්වයි. වෙස් මුහුණු නිර්මාණයේ අවස්ථාවකි.

(32) එක් හැඩතලයක් හෝ හැඩතල කීපයක් ඒකාකාරී ව්‍යාප්තියක් සහිතව පිටපත් කරමින් අඳිනු ලබන මෝස්තර / චීත්ත රෙද්දකට, ගවුම් රෙද්දකට අඳිනු ලබන මෝස්තර.

(33) හින්දු කෝවිල් ආශ්‍රිතව පවත්වන ශාන්ති කර්මයකි.

(34) ශ්‍රී ලාංකීය ජනප්‍රිය චිත්‍රකතා ශිල්පියෙකි. / ''නලදමයන්ති'' ''අරාබි නිසොල්ලාසය'' ආදී චිත්‍ර කතා ඇඳි ශිල්පියෙකි.

(35) ළඟ ඇති වස්තූන් විශාලවත්, දුර ඇති වස්තූන් කුඩාවටත් පෙන්වීම පර්යාවලෝකනයයි.

(36) ලාක්ෂා කර්මාන්තය

(37) වැල්පොත / පලාපෙති/ දෙපට ලණුව / ගල් බිංදුව / කුන්දිරප්පන් / ලණු දඟය / බෝ කොල / තනිපට ලණුව / තනි බිංදුව (සැරසිලි අංග 2 ක් ඇත්නම් ලකුණු ලබා දෙන්න.)

(38) මාතලේ - හඳුවිද
තංගල්ල - අඟුල්මඩුව
මහනුවර - හුරීකඩුව
බලංගොඩ- පල්ලෙකන්ද
} ප්‍රදේශ 2 ක් ඇත්නම් ලකුණු ලබා දෙන්න

(39) නියපොතු වැඩ හා පට්ටල් වැඩ

(40) නිල්, කහ, රතු, කළු, සුදු, කොල වැනි වර්ණ භාවිත කරයි. ස්වභාවික ද්‍රව්‍ය භාවිතයෙන් වර්ණ සාදාගනියි.